# වාරිමාර්ග අමාත්‍යාංශය

## ඇබෑර්තු

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

### අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුවේ සහන ණය පහසුකම් සමග වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන 2024 වසරේදී සම්පූර්ණ කිරීමට අපේක්ෂිත මහවැලි බහුකාර්ය සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන සැලැස්මේ එක් කොටසකි.

**අයදුම්පත්**

මතු දැක්වෙන තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට යෝග්‍ය සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. තම ජීව දත්ත සහිත අයදුම්පත් සමග අධ්‍යාපනික වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද ආදී මූලික සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ඇමතුම් අංක පිළිබඳ විස්තර සමග **"කොළඹ 10, ටී. බී. ජායා මාවතේ, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන, වැඩසටහන් අධ්‍යක්ෂ"** යන ලිපිනයට 2022.10.25 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න. ඊට අමතරව එම අයදුම්පතම ඍජු පිටපතක් ලෙස hr.mwsip@gmail.com වෙත පිටපත් කිරීම මගින් pdadbproject@gmail.com වෙත ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

| තනතුර හා රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
| --- | --- |
| **ජාතික සම්බන්ධිකාරක - වනජීවී කළමනාකරණ සැලැස්ම (PS04- ප්‍රභේදය A) ක්‍රියාත්මක කරලීම.**<br>**සේවා ස්ථානය : මඩටුගම/ පොල්පිතිගම.**<br>**තනතුරු 01 යි**<br>**රැකියා පැතිකඩ :**<br>● වනජීවී කළමනාකරණයට අදාළ සැලසුම් කිරීම, ක්‍රියා වෙහි යෙදවීම හා අධීක්ෂණය කිරීම, පිළිබඳ පළපුරුද්ද, වන සතුන් සඳහා වාසභූමි වැඩි දියුණු කිරීම, වැව්වල පාරිසරික පිළිසකර කිරීම් සහ අලිමංකඩ ප්‍රකාශයට පත් කිරීම, කුමු වැටවල් හා ස්ථිර ගම් වැටවල් ස්ථාපනය, අලින්ට රේඩියෝ කොලර දැමීම යනාදිය ආවරණිත ප්‍රදේශ විය යුතුය.<br>● අදාළ ආයෝජන නියෝජිතායතන සමග සම්බන්ධීකරණය පැවැත්වීම හා ඔවුන්ගේ සහාය සැලැසුම් කළ ක්‍රියාකාරකම් ක්‍රියාවෙහි යෙදවීමෙහිලා ලබාගැනීම.<br>● වනජීවි කළමනාකරණ සැලැස්මේ (WMP) ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරලීම සඳහා වාර්ෂික ක්‍රියාත්මක කරලීමේ සැලැසුම් හා ප්‍රසම්පාදන සැලැසුම් පිළියෙල කිරීම.<br>● අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයන් හිදී (PIU) ජ්‍යෙෂ්ඨ පරිසර නිලධාරීන් (SEO) හා සමීපව සම්බන්ධීකණය සිදුකිරීම, PIU මට්ටමින් WMP ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට ඔවුන්ට සහය වීම.<br>● WMP ක්‍රියාකාරකම් ඇතුළුව මාසික ත්‍රෛයිසි මාසික හා වාර්ෂික වාර්තා පිළියෙල කරීම.<br>● WMP ක්‍රියාත්මක කිරීමේ ප්‍රදේශ සඳහා SEO නිලධාරීන් දෙනු ලබන විස්තර යොදා ගනිමින් GIS සිතියම් පිළියෙල කොට යාවත්කාලීන කිරීම.<br>● WMP හි ක්‍රියාකාරකම් සඳහා PIC කාර්ය මණ්ඩල හා සම්බන්ධීකරණයෙන් ලංසු ලිපිලේඛන පිළියෙල කිරීම. | ● (පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද සහ වැටුප් මට්ටම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 හා අනුරූප වේ)<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමා කළ ප්‍රථම උපාධිය<br>හෝ<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකම් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්.<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ සමාන වෘත්තීය සුදුසුකමක්<br>**සමග**<br>අඩු තරමින් අදාළ ක්ෂේත්‍රයේ වසර 09 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br>2. රජයේ දීපව්‍යාප්ත සේවා iii/ii හෝ ඉහළ පංතියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක්<br>**සමග**<br>iii/ii පංතියේ තනතුරක අඩු තරමින් වසර 09 ක පළපුරුද්ද.<br>වැටුප් මට්ටම : PS4, ප්‍රභේදය A - රු. 155,000.00 - රු. 170,000.00 |

* MSD චක්‍රලේඛ අංක 01/2019 පරිදි ඉහත පැහැදිලිව සඳහන් කර ඇති වැටුප් වලට අමතරව ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

1. අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩු විය යුතුය.
2. සියලුම නිලධාරීන්, අදාළ රජයේ සංවිධාන සහ වෙනත් නියෝජිතායතන හා සමග සහයෝගයෙන් හා සම්බන්ධීකරණයෙන් තම රාජකාරී ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු වේ.
3. ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාව රජයේ රෙගුලාසි හා හුරුපුරුදුතාව සහ පරිගණක සාක්ෂරතාව මෙම තනතුරු සඳහා අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතා වේ.
4. රැකියා නියුක්ති කොන්ත්‍රාත්තු, කාර්යසාධනය සහ වැඩසටහන්/ ව්‍යාපෘතිවල අවශ්‍යතාව මත වාර්ෂිකව අලුත් කළ හැකි පදනම මත වසරක කාලයක් සඳහා වේ.
5. කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හා ඉක්බිති යම් සංශෝධන පරිදි රජයේ අනුමත වැටුප් පරිමාන දීමනා සමග හිමිවේ. (http://www.treasury.gov.lk)
6. දීර්ඝ වේලාවන් හි හා සති අන්තයන්හි වැඩ කිරීමේ හැකියාව.

ඉහළ සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කෙරෙන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, කුසලතා මත පදනම්ව තෝරා ගැනීම සිදු කෙරේ. එම නිසා බඳවා ගැනීමේ ක්‍රියාදාමයට යම් බලපෑමක් හෝ නියෝජනයක් සිදුකිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වනු ඇත. රජයේ සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩල/ සංස්ථා සහ වෙනත් රජයේ ආයතනවල අයදුම්කරුවන් තම අයදුම්පත් තෝරාගනු ලැබුවහොත් පූර්ණකාලීන පදනම මත ඔවුන්ව මුදා හැරිය හැකි බව ප්‍රකාශ කරන අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන් නොසපුරාලන අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම්,**
**වාරිමාර්ග අමාත්‍යාංශය.**